පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සබරගමුව

සති පාසල

විෂය-පෙරදිග සංගීතය

ජුලි මාසය

ශ්‍රේණිය-9

2 - සතිය

1.පාඩම හෝ ඒකකය- C,G,F,B Flat Scale

2.නිපුණතාවය 8.0 -සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත් දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කර ගනියි.

3.නිපුණතා මට්ටම 8.1 - බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ කුසලතා ලබයි.

4.පෙර ඉගෙනුම් අවස්ථා/ශිෂ්‍යා කළ යුතු කාර්යයන් :

ඔබ සඬ්ජ භාවයෙන් හා මධ්‍ය භාවයෙන් ස්වර ලිවීම යන පාඩම මතකයට නඟා ගන්න.

https://youtu.be/2w1-  --1tTA?list=PLQX7SVzJRMEykqp1u1-SvbkxIRW-DAsER

- බටහිර  ක්‍රමයට ස්කේල රාශියක් ඇත.සෑම ස්වරයක්ම මූල් කොට ගෙන ස්කේල ගොඩනැඟිය හැක. පහත link එක ඔස්සේ  ස්කේල් යනු කුමක්දැ,යි හඳුනා ගනිමු.
  - Youtube   - https://youtu.be/ldmGTbpl2dI
    https://youtu.be/Ue1tcSlZKiM
  - eනැණපියස  : -
  - eතක්සලාව : -

අතිරේක පොත්/සඟරා :

1.අතිරේක කියවීම් පොත- පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය
2.සංගීත අධ්‍යයනය-ගුණපාල විතානගේ මහතා
3.ජානක බණ්ඩාර ජයලත් - පෙරදිග සංගීතය-9 ශ්‍රේණිය

- එසේ තාක්ෂණය ඔස්සේ නැරඹිය නොහැකි දරුවන් සඳහා මෙම බටහිර ස්වර සංකේත පිළිබඳ හැදෑරීමට කියවීම් පත්‍රිකාව උපයෝගී කර ගන්න.

## <u>කියවීම් පත්‍රිකාව</u>




අප ඉතා හොඳින් දන්නා ස රි ග ම ප ධ නි ස ආරෝහණ ස්වර අෂ්ටකය C Major Scaleයට අයත්ය.ස්වර සප්තකය තුළ අර්ධ ස්වර පරතරයන් නැතිනම් Semi Tone 12 ක් ඇත.Semi tone දෙකක පරතරය සම්පූර්ණ ස්වර පරතරයක් නැත්නම් Tone 1 ක් ලෙස හඳුන්වයි.

මෙසේ ස්වර සප්තකය තුළ අන්තර්ගත මෙම අර්ධ ස්වර පරතරයන් නැතිනම් Semi tone පරතරයන් හඳුනා ගැනීම Scales නිර්මාණයේදී අපට වැදගත් වේ.

### Major Scale

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C මේජර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | | රි | | ග | ම | | ප | | ධ | | නි | ස |
| F මේජර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ම | | ප | | ධ | නි | | ස | | රි | | ග | ම |
| G මේජර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ප | | ධ | | නි | ස | | රි | | ග | | ම/ | ප |
| B♭ මේජර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| නි | | ස | | රි | ග | | ම | | ප | | ධ | නි |

## Minor Scale

| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| C මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ස | | රි | ග | | ම | | ප | ධ | | නි | | ස |
| F මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ම | | ප | ධ | | නි | | ස | රි | | ග | | ම |
| G මයිනර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| ප | | ධ | නි | | ස | | රි | ග | | ම | | ප |
| $B^b$ මේජර් ස්කේල් | | | | | | | | | | | | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 1 |
| නි | | ස | රි | | ග | | ම | ම´ | | ධ | | නි |

5.මෙම සතිය තුළ නියමිත පාඩම්වලින් ලබා ගත යුතු ඉගෙනුම් ඵල :

- බටහිර සංගීත ප්‍රස්තාරයක භාවිත වන සංකේත කිහිපයක් පැහැදිලි කරයි.
- එම සංකේත ලියා දක්වයි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේදී අවශ්‍යතාව පිළිගනියි.
- බටහිර ක්‍රමයට ප්‍රස්තාර කිරීමේ කුසලතාව ලබයි.

6.ඇගයීම්/තක්සේරුකරණ ක්‍රමවේද හා ආකෘති :

ඔබ Manuscript Book භාවිත කර පහත සඳහන් Scale ලියා සංගීත විෂය භාර ගුරුතුමාට/ගුරුතුමියට පෙන්වා නිවරදි බව තහවුරු කර ගන්න.

1. C major Scale
2. C minor Scale
3. G major Scale
4. G minor Scale
5. F major Scale
6. F minor Scale
7. B Flat major Scale
8. B Flat minor Scale